**ජාතික ප්‍රජා ජල භාරය - 2014**

---------------------------------------

ජාතික ප්‍රජා ජල භාරයේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, අංක 1443 හා 2011 දෙසැම්බර් 30 දිනැති ජාතික ප්‍රජා ජල භාර ඔප්පුවේ 16 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ඉදිරිපත් කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් භාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රජා ජල භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් රු. 58,901,841 ක් වූ දේපල පිරියත හා උපකරණ සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.144,535 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන තුල 2013 වර්ෂයට අදාළ රු. 140,515 ක් වූ පොළී ආදායමක් ඇතුළත්ව තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාළව රු.44,167 ක්වූ ලැබිය යුතු පොළී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ජර්නල් සටහන් අංක 134 මගින් ස්ථාවර වත්කම් වටිනාකම රු.6,205,462 කින් වැඩි කිරීමට අදාල තොරතුරු හා එහි බැර සටහන යොදන ලද ගිණුමට අදාල කිසිදු පැහැදිලි කිරීම් සහ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

එකතු වටිනාකම රු.8,500 ක්වූ චෙක්පත් තුනක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් රු. 18,216 ක් වූ අතර ඒ තුළ ඇතුළත් ගොඩනැගිලි කුළී රු. 10,697 ක් 2013 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණි.

(ආ) ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය මගින් වෙන්කළ අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කිරීමේ ගාස්තුවලින් රු.763,229 ක් 2012 වර්ෂයේදී ජාතික ප්‍රජා ජල භාරයේ කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා සහ රු.531,346 ක් සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් කාර්යාලවල පුනරාවර්තන වියදම් සඳහා උපයෝගි කරගෙන තිබුණි. ඒ අනුව ප්‍රජා මූල සංවිධානවලට ගෙවිය යුතු ලෙස හා ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ලෙස රු. 1,294,575 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ජාතික ප්‍රජා ජල භාරයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 88,218 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,109,256 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,021,038 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ප්‍රජා සංවර්ධන වියදම් රු.14,573,087 කින් අඩු වුවද ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයෙන් ලද මුදල් රු. 13,477,661 කින් අඩුවීම හා පරිපාලන හා ආයතන වියදම්වල රු. 2,357,348 ක වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 4.1 කාර්යසාධනය

---------------

ජාතික ප්‍රජා ජල භාරය විසින් ප්‍රජා මූල සංවිධානවල ජල සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම හා ප්‍රජා මූල සංවිධානවල ස්වයංපෝෂිතභාවය ඇති කිරිම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 45,521,008 ක් වැය කර ප්‍රජා මූල සංවිධානවලට ජල පොම්ප හා උපාංග සපයා තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේදී ජාතික ප්‍රජා ජල භාරය වෙත ලබාදී තිබුණු රු. 52,560,198 ක් වූ වත්කම් තක්සේරු කර විධිමත් පරිදි පවරා ගැනීමට භාරය විසින් සමාලෝචිත වර්ෂයේදී හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කිරීමේ ගාස්තු ගිණුමේ රු. 3,530,700 ක් ශේෂපත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කිරීම සඳහා අයකරන ගාස්තුව එම සංවිධානවලට ජලය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා උපයෝගී කරගැනීමට තිරණය වී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ගිණුම්කරණය